### රතු මයිටාවන්



කුඩා රතු පැහැති ඕවලාකාර සතුන් වේ. පත්‍රවල යට පැත්තේ දැලක් මෙන් මෙම සතුන් දැකිය හැක. හානි කල පත්‍ර රැලිවීම සහ සහවීම සිදුවේ.

නිර්දේශිත කෘමිනාශක

රසායනික නාමය
හෙක්සිතයසොක්ස් 10% ඩබ්. පී.
ෆ්ලුෆෙනොක්සියුරොන් 10 ඊ. සී.
ඇබමෙක්ටින් 1.8 ඊ. සී.

## රෝග හා පාලනය

### අංගාර කුණුවීම

පැළවල පාදස්ථ ප්‍රදේශයේ කඳ, මැටි පැහැයෙන් දුර්වර්ණ වී කඳ දක්වා පැතිරීම, පත්‍ර කහ වී මැලවීම. මෙය පාලනය කිරීම සඳහා නියමිත පැළ ගහනයක් පවත්වා ගැනීම, සමතුලිත පොහොර ප්‍රමාණයක් යෙදීම සහ බෝග මාරුවක් කල යුතුයි.

### කරල් හා කඳන් අංගමාරය

දිලීරයක් මගින් ඇතිවේ. කඳන් සහ කරල් මත දුඹුරු පැල්ලම් ඇතිවේ. එම පැල්ලම් මත කළු පැහැති බීජාණු හටගනී. කරල් හටගන්නා අවස්ථාවේ රෝගය වැලඳුණු විට බීජ වර්ධනයට බාධා පැමිණේ. රෝගය දරුණු වූ විට පැළ මැරියයි. පාලනය සඳහා නිරෝගී බීජ භාවිතය,බීජ ප්‍රතිකාර කිරීම හා බෝග මාරුවක් කල යුතුයි.

### බැක්ටීරියා බිබිලි රෝගය

රෝග කාරකයා සැන්තොමෝනාස් ජේසිඹලි බැක්ටීරියාවයි. පත්‍රවල උඩ හා යටි පැත්තේ පළමුව ලා කොළ පාට කුඩා ලප ඇතිවේ. පසුව මෙය කහ වලල්ලකින් වටවූ දුඹුරු පාට බිබිලි බවට පත්වේ. මෙම රෝගී තත්වය පාලනය කිරීම සඳහා නිරෝගී බීජ භාවිතය සහ භෝග මාරුව කල යුතුය.

### කහාවන් විචිත්‍ර වෛරස් රෝගය



සුදු මැස්සා රෝග වාහකයාය. පත්‍ර කහ වී විචිත්‍ර වේ. බෝගයන්ගි වර්ධනය බාලවීමද, පත්‍රවල හැඩය අක්‍රමවත්වීමද සිදුවේ. පාලනය සඳහා රෝගී පැළ විනාශ කල යුතුය. වාහකයා මර්දනය සඳහා ධාරක වල් පැළෑටි විනාශ කිරීම හා කෘමිනාශක යෙදීම කල යුතුය.

### අංකුර අංගමාරය

රෝග වාහකයා පැළමැක්කා වේ. මෙම රෝගයේ රෝග ලක්ෂණ වන්නේ පැළවල අංකුර මිය ගොස් වැටේ. කඳ හා අතු දුඹුරු වර්ණ වීම හා ශාක මියයාම සිදුවේ. රෝග පාලනය සඳහා වාහකයා මර්දනය කිරීම, රෝග ආසාදිත ශාක කොටස් ඉවත් කිරීම හා වල් පැළෑටි මර්දනය කිරීම කළ යුතුය.

### බැක්ටීරියා කොළ අංගමාරය



බැක්ටීරියා මගින් රෝගය පතුරුවයි. රෝගය වැලඳුණු පත්‍ර මත කෝණාකාර ලප ඇතිවේ. එම ලප පළමුව කහ පැහැයට හුරු ලා දුඹුරු පැහැයක් ගන්නා අතර, පසුව තද දුඹුරු පැහැවී අවසානයේදී කළු පැහැවේ. පාලනය සඳහා නිරෝගී බීජ භාවිතය, බෝග මාරුව, රෝගී කොටස් විනාශ කිරීම.

## අස්වැන්න නෙලාගැනීම

අස්වනු නෙලන අවස්ථාවේ වියළි කාලගුණයක් පැවතිම ගුණාත්මයෙන් ඉහළ අස්වැන්නක් ලබාගැනීමට හැකිවේ. පත්‍ර සියල්ලම කහ පැහැ වී පතනය විය යුතුය. කරල් වලින් 95% පමණ දුඹුරුපාට වූ පසු සම්පූර්ණ ගසම කපා ගැනීම සිදුකරයි. ගස් පිටින්ම අව්වේ වේලා ගැනීමෙන් පසු උරවල හෝ ගෝනිවල දමා පොල්ලකින් තලා ගැනීමෙන් බීජ වෙන්කරගත හැක. ඉන්පසු පොළා පිරිසිදු කරගත් බීජ මඳ පවනේ වියළා ගත යුතුය.

## ගබඩා කිරීම

ගබඩා කිරීම සඳහා ගන්නා බීජ වල තෙතමනය 13% ඉක්මවා නොතිබිය යුතු අතර මේවා, පිරිසිදු වියලි බඳුන් තුල ගබඩා කල යුතුයි. සෝයා බෝංචි වල වැඩිපුර මේදය අඩංගුවන නිසා වැඩි කලක් ගබඩා කර තැබීමෙන් ජීව්‍යතාවය අඩුවිය හැක.


වැඩි විස්තර සඳහා : අධ්‍යක්ෂ, ක්ෂේත්‍ර භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, මහඉලුප්පල්ලම.

දුරකථන අංක : 025-2249177, 025-2249132



Designed by: AUDIO VISUAL CENTRE, Department of Agriculture, Peradeniya.
Printed by: AGRICULTURE PRESS, Peradeniya.


## අපි වවමු - රට නඟමු

දේශීය ආහාර නිෂ්පාදනය දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007-2010

# සෝයා බෝංචි




කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි

## දේශගුණික අවශ්‍යතා

අධික වර්ෂාව මෙන්ම අධික වියළි දේශගුණය බීජ ප්‍රරෝහනය දුර්වල කරයි. භෝගය ක්ෂේත්‍රයේ හොඳින් වැඩුනු පසු කෙටි කාලයකට පමණක් සීමාවන නියඟයන්ට ඔරොත්තුදීමේ හැකියාවක් ඇත. කරල් මෝරන අවධියේදී ඉතා අඩු වර්ෂාපතනයක් තිබිය යුතුය. අධික උෂ්ණත්වයක් පවතින කාලවලදී වගා කරනු ලබන භෝගවලින් ලබාගත හැක්කේ අඩු තෙල් ප්‍රමාණයකි. වර්ෂය මුළුල්ලේම වගා කල හැකි අතර කාලවත් ලෝම පස වඩාත් යෝග්‍ය වේ.

වියළි කලාපය හා අතරමැදි කලාපය භෝගය වගා කිරීමට ඉතාමත් සුදුසුයි.

## බිම් සැකසීම

සෙ.මී. 15-20ක් පමණ ගැඹුරට පස බුරුල් කල යුතුය. තෙතමනය හොඳින් රඳවා ගැනීමටත්, භෝගයේ මුල ගැටිති ඇතිවීම සඳහා බැක්ටීරියා ක්‍රියාකාරීත්වය දියුණු කිරීමටත් තෙතමනය විශේෂයෙන් වැදගත් වන නිසා පස ගැඹුරට පිළියෙල කිරීම ඉතා වැදගත් වේ.

## නිර්දේශිත ප්‍රභේද

| ලක්ෂණ | පී.බී. 1 | පී.එම්. 13 | පී.එම්. 25 |
|---|---|---|---|
| උස (සෙ.මී.) | 50-60 | 50-60 | 70-80 |
| අස්වැන්න කි.ග්‍රෑ/හෙක්. | 1700-2000 | 1700-2100 | 1700-2300 |
| දින ගණන | 80-85 | 90-95 | 95-100 |
| ජීව්‍යතාවය | මාස 3-4 අඩු | මාස 6-8 | මාස 6-8 |

## බීජ අවශ්‍යතාව (හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම්)

| පී.බී. 1 | පී.එම්. 13 | පී.එම්. 25 |
|---|---|---|
| 55 | 55 | 50 |







## වගා කාලය

මහ කන්නයේදී ඔක්තෝබර් අග භාගයේදී සිටුවීම වඩාත් යෝග්‍ය වන අතර යල කන්නයේ බීජ සිටුවීමට අප්‍රේල් මාසය සුදුසු වේ.

## බීජ ප්‍රතිකාර කිරීම

බීජ සිටුවීමට පෙර සුදුසු දිලීර නාශකයකින් (කැප්ටාන් හෝ තිරාම්) ග්‍රෑම් 4ක් බීජ කිලෝග්‍රෑම් 1ක මිශ්‍ර කරන්න. බීජ ප්‍රතිකාර කිරීමෙන් රෝග වලින් තුඩා පැළ ආරක්ෂාකර ගත හැක.

## බීජ ආමුකුලනය කිරීම

මීට පෙර රනිල භෝග වගා නොකරන ලද බිමකට සෝයා බෝංචි හඳුන්වාදීමේදී පමණක් අවශ්‍යවේ.

1. ක්‍රමය - හෙක්ටයාරයකට සිටුවීම සඳහා අවශ්‍ය බීජ ප්‍රමාණය (50kg) පොලවෙහි ගොඩගසා එයට ජලය කෝප්ප 2ක් ඉස තෙත්කර එම බීජ වලට බැක්ටීරියා මාධ්‍ය 250g ගෙන හොඳින් කවලම් කිරීම.

11. ක්‍රමය - බැක්ටීරියා මාධ්‍ය 250g ගෙන ජලය කෝප්ප දෙකක දියකර තලපයක් සාදා හෙක්ටයාර් එකකට අවශ්‍ය බීජ ප්‍රමාණය සමග හොඳින් කවලම් කිරීම.

- බැක්ටීරියා මාධ්‍ය කවලම් කරගත් බීජ හැකි ඉක්මනින් තෙත් පොලවෙහි සිටුවිය යුතුයි
- එම බීජ සූර්යාලෝකයට හෝ වියලීමට ඉඩ නොහැරිය යුතුයි

## බීජ සිටුවීම සහ පරතරය

පේළි අතර පරතරය සෙ.මී. 40 ද පැළ අතර පරතරය සෙ.මී. 5 ද විය යුතුය. වගා කිරීම සඳහා උසස් ගුණාත්මයෙන් යුතු බීජ තෝරා ගත යුතුය.

## පැළ තුනී කිරීම

සිටුවා සති 3 දී පමණ එක ස්ථානයක එක පැළයක් සිටින සේ පැළ තුනී කිරීම සිදුකල යුතුය. සිටුවා සති 3ක් පමණ ගත වූ පසු පැළ තුනී කිරීම, වල් මර්දනය සහ පොහොර යෙදීම යන කාර්යයන් තුනම එකවර සිදුකරනු ලැබේ.

## පොහොර යෙදීම (හෙක්ටයාරයට කිලෝග්‍රෑම්)

| අවස්ථාව | යූරියා | ත්‍රිත්ව සුපර් පොස්පේට් | මියුරියේට් ඔෆ් පොටෑස් |
|---|---|---|---|
| බීජ සිටුවීමට පෙර මතුපිට පොහොර | 50 | 150 | 75 |
| මල් පිපෙන අවධියේදී | 50 | | |

## වල් මර්දනය

වල් පැළෑටිවල වැඩීම හේතුකොට ගෙන අස්වැන්න අඩුවීමේ ප්‍රතිශතය සියයට 30ක් පමණ වේ. භෝගය වර්ධනය වන මුල් කාලයේදී වල් පැළෑටි මර්දනය කිරීම ඉතා වැදගත්ය. බීජ සිටුවා පිළිවෙලින් සති 3 දී හා 5 දී වල් මර්දනය කිරීම යෝග්‍ය වේ.

## ජල සම්පාදනය

යල කන්නයේදී භෝගය වගා කරන්නේ නම් ජල සම්පාදනය කිරීම අවශ්‍ය වේ. බීජ සිටවූ විගස ක්ෂේත්‍රයට ජලය සැපයීමෙන් බීජ ප්‍රරෝහනය දුර්වල වේ. එබැවින් බීජ සිටුවීමට පෙර ක්ෂේත්‍රයට ජලය සම්පාදනය කර අමතර ජලය වහනය වීමට ඉඩ හැරීමෙන් පසුව බීජ සිටුවිය යුතුය. සිටුවා පළමු මාසයේදී දින 4කට වරක්ද අස්වනු නෙලීමට සති 3ක් පමණ වනතුරු දින 7කට වරක්ද ජල සම්පාදනය කල යුතුය. බීජ සිටුවන විට හොඳ පාංශු තෙතමනයක් පැවතීම උපරිම බීජ ප්‍රරෝහනයක් සඳහා වැදගත්ය. තවද මල් පිපෙන අවස්ථාවේදී හා කරල් පිරෙන අවස්ථාවේදී මනා පාංශු තෙතමනයක් පැවතීම ගුණාත්මයෙන් යුතු ඉහළ අස්වැන්නක් ලබා ගැනීමට හේතු වේ.

## කෘමි හානි සහ පාලනය

බෝංචි මැස්සා



කුඩා කළු පැහැති මැස්සෙකි. පැළ අවධියේදී හානිය ඇති වේ. බිත්තර දැමීම සඳහා පත්‍ර මත ඩිම්බ නිධායකයෙන් සිදුරු කල ස්ථානවල සුදු පැහැති සලකුණු දක්නට ලැබේ. පත්‍ර සහ වී මැලවී යයි. ශාකයේ පස මතුපිටට ආසන්නව ඇති කඳ කොටස ඝන වී මහත් වීම හා පැල්ලම් ඇතිවීම සිදු වේ. යල කන්නයේ මැයි - ජූලි මාස වලදී හානිය වැඩිපුර දක්නට ලැබේ.

පාලනය

බීජ පැළවල පළමු පත්‍ර දෙක ඇති වනවිට (සිටුවා දින 5-7ක් පමණ) කෘමිනාශක යෙදීම ආරම්භ කල යුතුයි.

නිර්දේශිත කෘමිනාශක

රසායනික නාමය
ඩයසිනෝන් 50 ඊ. සී.
කාබොසල්ෆාන් 20 එස්. සී.

කරල් විදින දළඹුවා



වැඩුණු කෘමියා සලබයෙකි. කිටයා පත්‍ර, මල් හා කරල්වලට හානි කරයි. පාලනය සඳහා නිර්දේශිත කෘමිනාශකයක් භාවිතා කල හැක.

නිර්දේශිත කෘමිනාශක
රසායනික නාමය
තයෝඩිකාබ් 375 එස්. සී.
ක්ලෝර්ෆ්ලුවසියුරෝන් 5 ඊ. සී.
ෆෙන්වැලරේට් 10 ඊ. සී.